**තුරුසවිය අරමුදල**
**55/75, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**

**ඉතිහාසය කෙටියෙන්**

2000 අංක 23 දරණ පනත අනුව තුරුසවිය අරමුදල පිහිටුවා ඇත. කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම සඳහා ගුණාත්මක භාවයෙන් යුත් රබර් ෂීට් නිෂ්පාදනය කිරීමට ප්‍රමිතියෙන් යුත් උපකරන ලබාදී ඔවුන්ගේ නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලබාදීම තුරුසවිය අරමුදලේ පරමාර්ථයයි.

**ප්‍රධාන අංශය**

ප්‍රධාන කාර්යාලය - 55/75, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

**අරමුණු**

- කුඩා රබර් වතු හිමියන්ට ඉතිරිකිරීමේ පුරුද්ද ඇති කරවීම සහ ඔවුන්ගේ සමාජ හා ආර්ථික තත්වය ප්‍රවර්ධනය කිරීම.
- රබර් කර්මාන්තය ආශ්‍රිත වැදගත්වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- කුඩා රබර් වතුවල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීම සඳහා අවශ්‍ය රබර් පිරි සැකසුම් ඒකක සහ රබර් කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත් කර ගැනීම. වැඩි දියුණු කර ගැනීම හෝ පිහිටුවීම.
- එවැනි රබර් පිරි සැකසුම් ඒකකවල හෝ කර්මාන්තශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම.
- කුඩා රබර් වතු සංවර්ධන සමිති (තුරුසවිය සමිති) ලියාපදිංචි කිරීම සහ විධිමත් කිරීම සහ අරමුදල වෙත ලියිපදිංචි වූ එකී සමිතිවල සාමාජිකයින් සඳහා ආධාර ලබා දීම.

**ක්‍රියාකාරකම්**

- ප්‍රමිතියෙන් යුත් උපකරණ හඳුන්වා දීම සහ සම්පත් ලබා දීම.
- වැහි ආවරණ යෙදීම.
- ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදනය (දුම් ගෙවල්, සමූහ සැකසුම් මධ්‍යස්ථාන)
- නව තුරුසවිය සමිති පිහිටුවීම සහ ශක්තිමත් කිරීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- රබර් සමඟ අතුරු බෝග වගාව (කෙසෙල්, අන්නාසි)

**සම්බන්ධවිය හැකි පුද්ගලයන්**

| නම | දුරකථන අංක | ෆැක්ස් අංක | ඊමේල් |
|---|---|---|---|
| සභාපති, ශ්‍රියානි ප්‍රනාන්දු මිය | 2302628 | 2302630 | chairthuru@sltnet.lk |
| ප්‍රධාන විධායක නිලධාරී | 2304815 | 2302630 | chairthuru@sltnet.lk |